ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහජන ආරක්ෂක අමාත්‍යාංශය
**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

# ලංසු ආරාධනය (IFB)

## ලිපිකවර මුද්‍රණ යන්ත්‍ර 02ක් සැපයීම, භාරදීම, ක්‍රියාත්මක කිරීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා වන ප්‍රසම්පාදනය

### IFB අංකය : DRP/ACC/07/01/2024 - II

1. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, **ලිපි කවර මුද්‍රණ යන්ත්‍ර 02 ක් සැපයීම, භාරදීම, ක්‍රියාත්මක කිරීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා වන ප්‍රසම්පාදනය** යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2. ලංසු කැඳවීම **ජාතික තරගකාරී ලංසු පටිපාටිය** අනුව සිදු කෙරෙනු ඇත. (NCB)

3. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට, සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** ගණකාධිකාරී, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙතින් හෝ දුරකථන අංක **011 - 5 226 172** ඔස්සේ වැඩි දුර තොරතුරු ලබාගත හැකි ය. එමෙන්ම **2024.08.14 සිට 2024.09.09 දක්වා බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර,"සුහුරුපාය" ගොඩනැගිල්ලෙහි, 12 වන මහලෙහි, සී පර්යන්තයෙහි, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයෙහි** තබා ඇති ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකි අතර එම ලංසු ලේඛන දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙ ද **(www.drp.gov.lk)** පල කර ඇත.

4 උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, **2024.08.14 සිට 2024.09.09 දක්වා** වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** කාලය තුළ නැවත නොගෙවනු ලබන **ශ්‍රී ලංකා රුපියල් පන්දහසක් (5,000/-)** ගාස්තුවක් ගෙවා ගණකාධිකාරී (ප්‍රසම්පාදන), පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, සී අංශය, 12 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කර ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය ලබා ගත හැකි ය. **ගෙවීමේ ක්‍රමය වන්නේ මුදල් මගින් ගෙවීමයි.**

5 **2024.09.10 දින ප.ව. 2.00 හෝ ඊට පෙර**, "මුල් පිටපත" සහ "අනු පිටපත" ලෙස සටහන් කරමින්, පිටපත් දෙකකින් යුතුව වෙන වෙන ම මුද්‍රා තැබූ ලියුම් කවරයක බහා 3 ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලංසු ලැබෙන්නට සැලැස්විය යුතු ය, නැතහොත් **ගිණුම් අංශය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, සී කොටස, 12 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** යන ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. **ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයේ සිට දින හැත්තෑ හතක (77) කාලයක් හෝ මිල දී ගන්නා විසින් දීර්ඝ කරන දිනය දක්වා** ලංසු වලංගු විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු ලබාගැනීම අවසන් වූ වහාම පැමිණීමට අපේක්ෂා කරන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

6 **2024.08.21 වන දින ප.ව. 2.00 ට ප්‍රධාන ශ්‍රවණාගාරය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, සී කොටස, 13 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** යන ස්ථානයේදී පූර්ව ලංසු රැස්වීම පැවැත්වෙනු ඇත.

7. ලංසුව බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **කොන්ත්‍රාත්තුවේ නම සහ ලංසු කැඳවීමේ අංකය** සඳහන් කළ යුතු ය. සියලුම ලංසු, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද **ශ්‍රී ලංකා රුපියල් දෙලක්ෂ හතලිස් දහසක (240,000/-)** ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**
**12 වන මහල, "සුහුරුපාය"**
**ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**

SELACINE